**තුම්පනේ ප්‍රාදේශිය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 09 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 23 දින සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට තුම්පනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම.**

**-----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

**----------------------**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.**

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු.**

**---------------------**

**පහත සදහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ) ප්‍රධාන ලේකම් වෙතින් ලැබී තිබුණු අංක 52-6571 දරන කැබ් රථයේ සහ ප්‍රජා ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු අංක MO 4949 දරන යතුරු පැදිය සභාව වෙත පවරා ගෙන වටිනාකම් තක්සේරු කර, ගිණුම්ගත කර නොතිබුණි.**

**(ආ) ප්‍රධාන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.2,300,000 ක වටිනා අංක 301-5762 දරන මෝටර් රථය සභාව වෙත පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.568,084 ක හිග ජල ගාස්තු, ශේෂ පත්‍රයේ රු.359,027 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන්, රු.209,057 ක් අඩුවෙන්, ගිණුම්ගත කර තිබුණි.**

**1.3.3 නොසැසදු පාලන ගිණුම්.**

**-----------------------**

**ගිණුම් විෂයයන් 06 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්, උපලේඛන අනුව, ශේෂයන් සමග සැසදීමේ දි, රු.7,310,394 ක නොසැසදීම් අනාවරණය විය.**

**1.3.4 ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 04 ක එකතු වටිනාකම රු.2,576,495 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.1,257,586 ක් වී තිබුණි. එම ශේෂයෙන් 2014 සැප්තැම්බර් 30 දිනට රු.66,169 ක මුදලක් තවදුරටත් අය වියයුතුව පැවතුණි.**

**1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**---------------------------------------------------**

**ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසී සංග්‍රහයේ මු.රෙ.756ට අනුව, රු.412,876 ක් වටිනා විදුලි උපාංග භාණ්ඩ සමීක්ෂණය සදහා අදාළ කර ගෙන නොතිබුණි.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,622,755 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,195,460 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.1,572,705 ක අඩුවීමක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**-------------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමග සැසදීමේ දී, රු.1,572,705 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සදහා සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු සියයට 6.42 කින් අඩුවීම මෙන්ම, සැපයුම් උපකරණ සියයට 37 ක් ද, ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු සියයට 113 ක් ද, ආධාර මුදල් සියයට 39 කින් වැඩි වීම් ඇතුළු වියදම් විෂයයන් 08 ක වැඩිවීම් හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මුලු ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර අනුපාතය 1:.74 වූ අතර, පසු ගිය වර්ෂයේ එම අනුපාතය 1:.60 ක් වූයෙන්, එය ප්‍රශස්ථ මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. තව ද, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 83 ක් හෙවත්, රුපියල් මිලියන 28 ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු**

**ජංගම වගකීම්වලින් සියයට 59 ක් හෙවත්, රුපියල් මිලියන 26 ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**---------------------**

**2.4.1 බදු කුළී.**

**------------**

**2013 දෙසැම්බර් 31 දිනට අය වියයුතු රු.251,141 ක ශේෂයෙන් රු.50,169 ක් 2014 සැප්තැම්බර් 30 දිනට අය වියයුතුව පැවතුණි.**

**2.4.2 ජල ගාස්තු.**

**---------------**

**සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.506,554 ක හිගයක් පැවති අතර, වර්ෂය අවසානයේ හිගය රු.359,027 ක් විය. හිගයෙන් අයවීම සියයට 59 ක තරම් දුර්වල මට්ටමක පැවතුණු බැවින්, එම මුදල් අය කර ගැනීමේ විධිමත් වැඩපිළිවෙළක් සභාව ක්‍රියාත්මක කර නොතිබුණි.**

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**---------------------------**

**3.1 කාර්යසාධන ඇගයීම.**

**----------------------**

**ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව, වැඩසටහන් 05 ක අරමුණු ඉටු කිරීම සඳහා රු.17,553,223 ක වියදමක් දරා තිබුණු නමුත්, රජයේ දායකත්ත්වය හා වෙනත් අයහාර මගින්, ලැබී තිබුණේ එයින් සියයට 41 ක ප්‍රමාණයක් හෙවත්, රු.7,306,913 ක්පමණි.**

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**--------------------------------**

**සභා බල ප්‍රදේශයේ පුස්තකාල 05 කට අදාළව රු.43,055 ක් වටිනා බැහැරට රැගෙන ගොස් තිබුණු පොත් 260 ක් සාමාජිකයින්ගෙන් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**------------------------------------**

**4.1 සංයුක්ත සැළැස්ම.**

**---------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.**

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

**-----------------------**

**රු.37,404,983 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සදහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 විගණන හා කළමනාකරණ කමිටු.**

**-----------------------------------**

**සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත නොකිරීම හේතුවෙන් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.**

**4.4 අභ්‍යන්තර විගණනය.**

**----------------------**

**අභ්‍යන්තර විගණන නිලධාරීයකු පත් කර තිබුණ ද, ප්රමාණවත් විගණනයක් සිදු කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය**

**(ආ) ආදායම් පරිපාලනය**

**(ඇ) කොන්ත්‍රාත් පාලනය**